කොත්මලේ ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
---------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කොත්මලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ නොතිබුණු ලැමිනේටර් යන්ත්‍රයක වටිනාකම රු.94,900 ක් ලෙසට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු බැවින් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ එම වටිනාකමින් වැඩියෙන් දැක්වේ.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට අයත්ව තිබුණු රු.30,000 ක වටිනාකමැති ශබ්ද විකාශන යන්ත්‍රය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසරකට වැඩි කාල පරාසයක් ගතවී තිබුණු , ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව වූ රු.5,054,334 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්
---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසරකට වැඩි කාල පරාසයක් ගතවී තිබුණු, කර්මාන්ත ණය හිමියන් සඳහා ගෙවිය යුතු රු.4,717,714 ක ශේෂයක් පැවතුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
-------------------------------------------------------

හිමිකම් ඔප්පු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.52,808,348 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------

පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය අනුව වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව වසර 05කට වරක්වත් කළ යුතු වුවද කොත්මලේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අවසන් වරට වරිපනම් බදු දේපළ තක්සේරුකර තිබුණේ 2011 වර්ෂයේදීය.

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,290,001 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,420,600 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ. කෙසේ වුවද එම තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීමේදී නොසැසඳීම් පවතින බවද නිරීක්ෂණය විය.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,142,000 | 4,468,779 | 4,038,161 | 2,144,546 | 4,075,000 | 3,638,260 | 3,183,437 | 1,274,432 |
| කුලී | 3,990,000 | 3,582,536 | 5,450,203 | 196,775 | 3,727,300 | 3,806,879 | 3,632,584 | 142,345 |
| බලපත්‍ර ගාස්තු | 6,940,000 | 5,523,998 | 5,523,998 | - | 7,132,000 | 5,294,786 | 5,294,786 | - |
| වෙනත් ආදායම් | 11,800,000 | 3,592,926 | 6,573,310 | 1,860,153 | 12,565,700 | 11,345,774 | 10,217,484 | 4,911,930 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය
----------------------------------------

(අ) වරිපනම් හා බදු
-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය නොකළ හිඟහිටි වරිපනම් හා බදු ආදායම රු.1,555,241 ක් වූ අතර ඉන් රු.798,505 ක් වසර 01 ක් ඉක්මවා හිඟහිටව පැවතුණි.

(ආ) කුලී
-----

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය නොකළ හිඟහිටි කුලී ආදායම රු.196,775 ක් විය.

(ඇ) ජල ගාස්තු
-------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය නොකළ හිඟහිටි ජලගාස්තු ප්‍රමාණය රු.589,305 ක් විය.

(ඈ) වෙනත් ආදායම්
-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය නොකළ වෙනත් ආදායම් ප්‍රමාණය රු.3,119,747 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කාර්යසාධනය
-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ආරම්භ නොකළ කර්තව්‍යයන්
-----------------------------------

ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ රඳාගල්බඩ හා මීන් ජල යෝජනා ක්‍රම දෙකක් සඳහා ඉකුත් වර්ෂයේදී පිළිවෙලින් රු.1,897,315 ක් හා රු.1,083,915 ක් වැයකර ජල නල මිළදී ගෙන තිබුණද අදාළ ජල යෝජනා ක්‍රම ආරම්භකර නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
-----------------------------------

සභා බලප්‍රදේශය තුළ එකතුකරනු ලබන කසළ බැහැර කරන කොස්ගහපතන සහ හපුගස්තලාව කසළ බැහැර කරන ස්ථානවල එළිමහනේ කසළ දමා තිබෙන බව හා පොලිතීන් ඇතුළු මිශ්‍ර කසළ විධිමත් පරිදි බැහැර කිරීම සිදු නොකරන බව නිරීක්ෂණය විය.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත් වී තිබුණු අතර, ඒ වෙනුවෙන් 2017 වර්ෂයේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.2,287,140ක ගිවිසුම්වලට ඇතුළත්වී තිබුණි. ඒ යටතේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් තවලන්තැන්න සහ හරංගල ප්‍රදේශවල පොදු වැසිකිළි සකස්කිරීම සිදුකර තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

(අ) රම්බොඩ දිය ඇල්ල නරඹන්නන් සඳහා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නොමැති බැවින් වැසිකිළි පහසුකම් ලබාදීම සඳහා 2017 ඔක්තෝබර් 12 දින රු.55,000 ක් ගෙවා අපද්‍රව්‍ය බැහැර කරන ටැංකි (Septic Tank) 02 ක් මිලදීගෙන තිබුණද එම ටැංකි අදාළ ස්ථානයේ ස්ථාපනයකර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ හඳුනා ගන්නා ලද අනවසර ඉදිකිරීම් 96 ක් වූ අතර, ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

-----------------------------

3.3.1 වත්කම්වල ආරක්ෂාව, නඩත්තු හා අලුත්වැඩියා කටයුතු

---------------------------------------------------------------

ප්‍රාදේශීය සභාවට අයත් උපකාර්යාල දෙකක් හා පුස්තකාල දෙකක් විධිමත් පරිදි නඩත්තුකර නොතිබුණු අතර, ඒවායේ අලුත්වැඩියා කටයුතු සිදුකර නොතිබුණි. එමෙන්ම ඇතැම් උපකාර්යාල අනාරක්ෂිත තත්ත්වයෙන් පවතින බවද විගණනයේදී නිරීක්ෂණය විය.

3.3.2 නිෂ්ක්‍රීය වත්කම්

-------------------

(අ) 2016 වර්ෂයේ පළාත් සභා මන්ත්‍රී ආධාර යටතේ මිලදීගෙන තිබුණු රු.478,500 ක වටිනාකමැති සෙවිලි තහඩු 330 ක් අදාළ ප්‍රතිලාභීන්ට බෙදාහැරීමට කටයුතු නොකර ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ දමා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවට අයත් ගිලන් රථයක් හා යතුරුපැදියක් භාවිතයෙන් ඉවත්කර වසර 07 කට අධික කාලයක් ගතවී තිබුණු අතර, අලුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බෝගහවත්ත කලපිටිය මාර්ගය සංවර්ධනය කිරීමේදී සභාවට අයත් පැරණි ජල යෝජනා ක්‍රමයක් සඳහා භාවිතාකර තිබුණු විශ්කම්භය අඟල් 4 ක් වූ විවිධ දිග ප්‍රමාණවල ජල නල 51 ක් ද ඉවත්කර තිබුණු අතර ඒවා කිසිදු ප්‍රයෝජනයකට නොගෙන මල්දෙණිය රජයේ නිවාස භූමියේ ගබඩාකර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
-------------------------------------------

4.1 අයවැය පාලනය
--------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත වියදම්, තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී වියදම් විෂයයන් 08 ක සියයට 11 සිට සියයට 357 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
--------------------

විගණනයේදී නිරීක්ෂණ වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| ගිණුම්කරණය | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම |
| වත්කම්/ දේපළ | ලේඛනගත නොකිරීම<br>ආරක්ෂාව තහවුරු නොකිරීම |
| තොග | තොග නිකුත් නොකර රඳවාගෙන තිබීම |
| කොන්ත්‍රාත් | නියමිත ප්‍රමාණය ඉක්මවා ගෙවීම් කිරීම |